**වර්ෂ 2022 ක් වූ අප්‍රේල් මස 28 වන දින පෙ.ව 10.00 ට පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ වාර්තාව**

පැමිණීම

| | | |
|---|---|---|
| 01. ගරු උප සභාපති | - | එච්.ඒ නන්දසෝම මහතා |
| 02. ගරු මන්ත්‍රී | - | වී.මුරලිදරන් මහතා |
| 03. ගරු මන්ත්‍රී | - | ජී.එස්.ඒ ෆොන්සේකා මහතා |
| 04. ගරු මන්ත්‍රී | - | කේ.ඕ.සෝමතිලක මහතා |
| 05. ගරු මන්ත්‍රී | - | එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා |
| 06. ගරු මන්ත්‍රී | - | ශාන්තලාල් පෙරේරා මහතා |
| 07. ගරු මන්ත්‍රී | - | ටී.ඒ.ඩී.සී දමයන්ති මිය |
| 08. ගරු මන්ත්‍රී | - | එච්.ජී මෛත්‍රීපාල මහතා |
| 09. ගරු මන්ත්‍රී | - | එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය |
| 10. ගරු මන්ත්‍රී | - | අයි.රාමකිලි මහතා |
| 11. ගරු මන්ත්‍රී | - | ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා |
| 12. ගරු මන්ත්‍රී | - | කේ.ඕ කුසුම්ලතා මිය |
| 13. ගරු මන්ත්‍රී | - | එස්.එල්.අරුණ ශාන්ත මහතා |
| 14. ගරු මන්ත්‍රී | - | එන්.එම් සුසිලා දමයන්ති මිය |
| 15. ගරු මන්ත්‍රී | - | එච්.ජී මහින්ද ගුණසේකර මහතා |
| 16. ගරු මන්ත්‍රී | - | එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා |
| 17. ගරු මන්ත්‍රී | - | එච්.ඒ.එන්.සී රණසිංහ මහතා |
| 18. ගරු මන්ත්‍රී | - | පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි |

නොපැමිණීම

| | | |
|---|---|---|
| 19. ගරු සභාපති | - | ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා |
| 20. ගරු මන්ත්‍රී | - | ජී.කේ.පී ෆොන්සේකා මිය |

**01. පසුගිය මහා සභා වාර්තාව සභා සම්මත කිරීම**

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා

පසුගිය සභා වාර්තාවේ අපි අහල තිබුණා ලේකම්තුමියගෙන් අයවැය සභා සම්මත උනේ මොන සභාවෙදිද කියලා.ඒකට පිළිතුරක් නෑ.ඒ නිසා සභා වාර්තාව සභා සම්මත කරන්න බෑ.වාර්තාව අත්සන් කරලත් නෑ.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා

ගරු සභාපතිතුමාට අද සභාවට හදිසි අවශ්‍යතාවයක් හේතුවෙන් පැමිණීමට නොහැකි බව දැනුම් දුන් බව සභාවට මම දැනුම් දෙනවා.අයවැය සභා සම්මත වීම නීත්‍යානුකූල නැ කියලා ඔබතුමාලා වාර දෙකක්ම පැමිණිලි කරා.ඒ අනුව පරික්ෂණ කරා.නීතිපතිතුමාට ඉදිරි තීරණය ගන්න කියලා දැනුම් දීලා තියෙනවා කියලා කොමසාරිස්තුමා දැනුම් දීලා තියෙනවා.එතෙක් අපිට මේ සභාව අවිච්ජින්නව පවත්වා ගෙන යන්න පුලුවන්.පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය අපිට අනුමත කරලා දුන්න අයවැය අනුව අපි ඉදිරි කටයුතු කරගෙන යනවා.සභා වාර්තාව නීත්‍යානුකූල වෙන්නේ සංශෝධන සහිතව අත්සන් කළොත් තමයි.අද ඔබතුමාලා ඉදිරිපත් කරන සංශෝධන සටහන් කරලා තමයි මේ වාර්තාව අත්සන් කරන්න ඕනි.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා

මෛත්‍රීපාල මන්ත්‍රීතුමා ඇහුවේ අයවැය සම්මත නොකර අයවැය සම්මත කරා කියලා වාර්තාවේ දාලා තියෙන්නේ ඇයි කියලා.අපිට අවශ්‍ය පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය ඇවිත් මේ සභාව පවත්වා ගෙන යාමට අවශ්‍ය වියදම් කිරීමට බලය දුන්නා කියලා සභා වාර්තාවේ සඳහන් කරන්න.

ගරු මන්ත්‍රී පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි
නීතිපති උපදෙස් ඇවිත් තියෙන්නේ.

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා
අපිට ආරංචියක් ආවා ලේකම්තුමියට පිටපතක් ආවා කියලා.

ගරු මන්ත්‍රී එම්.ජී ඩබ්.කේ.එස් මැණිකේ මිය
මං සංශෝධනයක් ඉදිරිපත් කරේ ලේකම්තුමිය වැරැද්දක් කරනවාද දන්නේ නෑ සභාවේ සභාපතිතුමා වැරැද්දක් කරනවාද දන්නේ නෑ කියන කථාව.2021.12.17 විශේෂ මහා සභා වාර්තාව සභාවට දැම්මේ නෑ.ඒක ගැන කථා කරපු දේවල් සටහන් වෙලත් නෑ.

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා
පෙබරවාරි මාසේ තිබුණා පෙර පාසල් වලට බඩු ගන්න මුදල් වෙන් කරලා.මාර්තු මාසේ මං ඇහුවේ ඒක ගැන.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
ඒක සභාව සතු පෙර පාසලක් නිසා එම පෙර පාසලේ කටයුතු සඳහා මුදල් වියදම් කිරීමට බලයක් තියනවා.

ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය
එදා සහකාර කොමසාරිස්තුමිය ඇවිත් සම්මත කරපු අයවැය ගැන අහන කොට අපිට කිව්වේ මහා සභාවට ඉදිරිපත් කරනවා කියලා.නමුත් එදා ඔබතුමාගෙන් අපි අහනකොට සහකාර කොමසාරිස්තුමිය සම්මත කරපු අයවැය පිළිබඳ ඔබතුමාලා අපිට ඒක දුන්නේ සභාවත් ඉවර වෙලා.සභාවට දාලා සම්මත උනාට පස්සේ තමයි වියදම් කරන්න පුලුවන් කියලා කිව්වා.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
මෛත්‍රීපාල මන්ත්‍රීතුමා ඔබතුමා දන්නවා ඇති මේ සභාවේ විපක්ෂ නායක කියලා තනතුරක් නෑ.සභාවේ වාඩි උනාට පස්සේ සියලු දෙනාම එක හා සමානයි.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
ඔබතුමා කියනවනම් අයවැය සම්මත උනා කියලා අපිට ගැටලුවක් එනවා ඇයි එහෙනම් නීතිපති උපදෙස් සඳහා යොමු කළේ කියලා.තවම අපිට සභා වාර්තාව සභා සම්මත කරගන්න බැරි උනා.ඒ නිසා මෛත්‍රීපාල මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ප්‍රශ්නයට උත්තරයක් වශයෙන් පළාත් පාලන කොමසාරිස්තුමා විසින් නීතිපති උපදෙස් ලබා ගන්න යොමු කරලා තියෙනවා කියන එක උත්තරයක් විධියට ගමු.අපටත් වටිනාකමක් තියෙනවා එතකොට නීතිමය පැත්තෙන් ගියත්.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා

ගෙවීම් වවුචරය පරික්ෂා කරද්දී අපිට තේරෙනවා සභාවේ ලේකම්තුමිය ඇතුළු කාර්යය මණ්ඩලය සහකාර කොමසාරිස්තුමිය සම්මත කරපු අයවැයට පිටින් ගෙවීම් කරලා නෑ කියලා.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
අයවැය පළමුවර පරාද උනොත් දෙවනි වර ඉදිරිපත් කරන්න පුලුවන්.පළාත් පාලන කොමසාරිස් සහභාගී වෙලා ඊළග අයවැය ඉදිරිපත් කරන්න ඕනි.ඒ ක්‍රියාවලිය උනේ නෑ.පළාත් පාලන කොමසාරිස්තුමාට තියෙන පූර්ණ බලතල මොකටද එයා වෙන කෙනෙකුට දෙන්නේ.නීතියට ගියොත් එතුමත් වැරදි.

<u>ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා</u>
අපි 11 දෙනෙක් අයවැයට විරුද්ධ උනා.අපේ ස්වාමින් වහන්සේ අත ඉස්සුවේ නෑ කියලා ලේකම්තුමිය කියලා තිබුණා.

<u>ගරු මන්ත්‍රී  එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා</u>
2022 මාර්තු මස මහා සභා වාර්තාව සංශෝධන සහිතව සත්‍ය වාර්තාවක් වශයෙන් සභා සම්මත කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව 2022 මාර්තු මස මහා සභා වාර්තාව සත්‍ය වාර්තාවක් වශයෙන් සභා සම්මත කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

**<u>02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන</u>**
<u>02 - 01 භාණ්ඩාගාර ලේකම්,මුදල් අමාත්‍යාංශය,කොළඹ 01</u>
රාජ්‍ය වියදම් පාලනය කිරිම යන මැයෙන් යොමු කර ඇති චක්‍රලේඛය සභාගත කරන ලදී.

<u>02 - 02 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
2022 සභා අරමුදල් සංවර්ධන යෝජනා යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 03 පළාත් පාලන සහකාර කොමසාරිස්,පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,පල්ලේකැලේ</u>
මාර්ගයක් සදහා කුඹුරු ඉඩමකින් කොටසක් අත්පත් කර ගැනීම - ගලේවෙල ප්‍රාදේශීය සභාව යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 04 ලේකම්,පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය,කොළඹ 02</u>
සුපිරිසිදු පරිසරයක් නිරෝගිමත් හෙටක් මැයෙන් දීප ව්‍යාප්ත ඩෙංගු මර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරිම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 05 ආණ්ඩුකාර ලේකම්,ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,මහනුවර</u>
නාවලපිටිය වැලිගම්පළ ශ්‍රී ඉසිපතනාරාම විහාරස්ථානයේ විහාරගෙයි අබලන්ව ඇති වහලය අලුත්වැඩියා කිරිම වෙනුවෙන් රු:73260.00 මුදලක් සභා අරමුදලින් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 06 ලේකම්,ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
සභාවට අයත් 252 – 6380 දරණ කැබ් රථය අලුත්වැඩියා කිරිම - පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 07 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
නාවලපිටිය වැලිගම්පළ ශ්‍රී ඉසිපතනාරාම විහාරස්ථානයේ විහාරගෙයි අබලන්ව ඇති වහලය අලුත්වැඩියා කිරිම වෙනුවෙන් රු:73260/- මුදලක් සභා අරමුදලින් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 08 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
ගරු විෂයය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම - පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 09 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
තාක්ෂණ නිලධාරි සේවයේ පුරප්පාඩු සම්බන්ධවයි යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 10 අධ්‍යක්ෂ,මධ්‍යම පරිසර අධිකාරිය,පොල්ගොල්ල
පාරිසරික ආරක්ෂණ බලපත්‍රය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 11 අධ්‍යක්ෂ,මධ්‍යම පරිසර අධිකාරිය,පොල්ගොල්ල
පාරිසරික ආරක්ෂණ බලපත්‍රය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 12 ප්‍රාදේශීය ලේකම්,පස්බාගේ කෝරළේ,නාවලපිටිය
වැලිගොඩවත්ත ෂෙම්රොක් ඉඩමෙන් කොටසක් ප්‍රාදේශීය සභාවට පැවරීම හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සඳහා දීර්ඝ කාලීන බදු ලබා දීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 13 දිස්ත්‍රික් ලේකම්,දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,මහනුවර
සුරකිමු ගංගා ව්‍යාපෘති යෝජනා සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 14 ප්‍රාදේශීය ලේකම්,පස්බාගේ කෝරළේ,නාවලපිටිය
ප්‍රාදේශීය සෞඛ්‍ය කමිටු වාර්තාව යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 15 පළාත් පාලන සහකාර කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
විමර්ශන වාර්තාව සේවක ඇප ලබා ගැනීමේ කටයුතු පරික්ෂාව යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 16 පළාත් පාලන සහකාර කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
විමර්ශන වාර්තාව බලතල පැවරීමට අදාල කටයුතු පැවරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 17 පළාත් පාලන සහකාර කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
විමර්ශන වාර්තාව - ස්ථාවර වත්කම් සමීක්ෂණය හා ස්ථාවර වත්කම් ආරක්ෂා කර ගැනීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 18 ආණ්ඩුකාර ලේකම්,ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,මහනුවර

නාවලපිටිය රඹුක්පිටිය ශාන්ත ජනපදය සමගි සුභසාධක සමිතිය සඳහා සෙවිලි තහඩු ලබා දීම වෙනුවෙන් රු:23760.00 ක මුදලක් සභා අරමුදලින් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 19 අධ්‍යක්ෂ,මධ්‍යම පරිසර අධිකාරිය,පොල්ගොල්ල
පාරිසරික ආරක්ෂණ බලපත්‍රය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

**03. මහජන පෙත්සම්, පැමිණිලි හා ලිපි ඉදිරිපත් කිරිම**
නැත

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**
නැත

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා**
05 - 01 ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා
හෙඩ්‍රි ග්‍රාම සේවා වසමේ ග්ලිස්ටන් ගම රොසැල්ල පිහිටි ශ්‍රී ඥාන ගනේෂර් කෝවිලට අඩි 1 ½ උස මුහුණු 05ක් තිබෙන පිත්තල ශ්‍රී ඥාන ගනේෂර් දෙවියන්ගේ දේව රූපයක් ලබා ගැනීම සඳහා 2022 වර්ෂයට අදාලව මා හට හිමි රුපියල් ලක්ෂ 03ක ප්‍රතිපාදන මුදල හා ගරු සභාපතිතුමාගේ ප්‍රතිපාදන වලින් එතුමා දීමට එකඟ වූ රු:50,000.00 මුදලද එකතුව රු:ලක්ෂ 3 ½ මුදල අදාල දේව රූපය ලබා ගැනීමට ලබා දීමත් එම දේව රූපය ශ්‍රී ඥාන ගනේෂර් කෝවිලට ලබා දීම සුදුසු බවටත් මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එච්.ජී මහින්ද ගුණසේකර මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 02 ගරු මන්ත්‍රී එච්.ජී මහින්ද ගුණසේකර මහතා
මාගේ 2022 වර්ෂය සඳහා ලබා දෙන රු:ලක්ෂ 3 ප්‍රතිපාදන මුදලින් දෙකේ කණුව සිල්වාස්ලැන්ඩ් ගීත මහතාගේ නිවස අසලින් චන්දන මහතාගේ නිවස දක්වා ඇති මාර්ගය සංවර්ධනය කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 03 ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
උඩවලව්වත්ත මාර්ගය සංවර්ධනය කිරිම සඳහා රු:50000.00 මුදලක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 04 ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>

2022 වර්ෂය සඳහා මා වෙත වෙන් කරන ලද මුදලින් මෙහි පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

- බලංතොට සමුපකාරය අසල ප්‍රජා ශාලාව සඳහා දැල් ආවරණය කොට සකස් කිරිම - රු:200,000.00
- බලංතොට සමුපකාරය අසල ප්‍රජා ශාලාවේ ශ්‍රම පදනම මත ඉදි කෙරුණු කොටස සඳහා ඇස්බැස්ටස් සෙවිලි තහඩු ලබා දීම - රු: 40,000.00
- අලුත්ගම ග්‍රාම නිලධාරි වසමේ දිළිදු පවුලක් සඳහා දිග අඩි 10 ඇස්බැස්ටස් සෙවිලි තහඩු 08 ක් ලබා දීම - රු: 40,000.00

<u>ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනා අතරින් සෙවිලි තහඩු ලබා දීමේ යෝජනා 2 ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කිරිමටත් අනෙක් යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව කටයුතු කිරිම සුදුසු බවටත් ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 05 ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>

සභාවට අයත් TX 6021 යතුරු පැදිය ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නාවලපිටිය ඩිපෝවේ යාන්ත්‍රික ඉංජිනේරු විසින් පරික්ෂා කර තක්සේරු කර ලේඛනගත කර ඇත.මෙම යතුරු පැදිය 2013 වර්ෂයේ ප්‍රජා ජල ව්‍යාපෘතිය සඳහා ලැබී ඇති බැවින් දැනට ජල අංශයේ මනු කියවීම හා ආදායම් එකතු කිරිම රාජකාරි කටයුතු ඉටු කරන ආදේශක කම්කරු අකිල චන්දිම මයා වෙත ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එච්.ජී මහින්ද ගුණසේකර මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.සභාව සතු වත්කමක් නම් සභාවේ වැඩ වලට ගමු.එක්කෙනෙකුට දීපුවම ඒක පෞද්ගලික දෙයක් බවට පත් වෙනවනේ.නඩත්තු කටයුතු සභාවෙන් කරන්නත් ඕනිනේ.මාසෙකට අපිට දෙන්න පුලුවන් තෙල් ප්‍රමාණය තීරණය කරමු.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව අකිල චන්දිම මයා වෙත යතුරු පැදිය ලබා නොදී සභාවේ කටයුතු සඳහා යතුරු පැදිය සභාවේ තබා ගැනීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 06 ගරු මන්ත්‍රී පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි</u>

2022 වර්ෂයේ ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන වලින් හයිඩ්‍රි වත්ත ශ්‍රී මුත්තුමාරි අම්මාන් දේවස්ථානයට සිමෙන්ති ලබා දීම සඳහා රු:50,000.00 මුදලක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරන අතර එම භාණ්ඩ ශ්‍රී මුත්තුමාරි අම්මාන් දේවස්ථානයට වෙත ලබා දීම සුදුසු බවටත් මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 07 ගරු මන්ත්‍රී පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි</u>

රොසැල්ල හයිඩ්‍රි වත්ත ශ්‍රී බෝධිරාජ විහාරස්ථානයට අවශ්‍ය කරන සාස්පාන් කට්ටලයක් ලබා ගැනීම සඳහා මා හට වෙන් කරන මුදලින් රු:40,000.00 මුදලක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරන අතර එම භාණ්ඩ විහාරස්ථාන කාර්ය සාධක සමිතිය වෙත ලබා දීම සුදුසු බවටත් මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 08 ගරු මන්ත්‍රී පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි</u>

රොසැල්ල ටෙම්පල්ස්ටෝ වත්ත පිහිටි පොදු වොලිබෝල් ක්‍රීඩා පිටියට අවශ්‍ය විදුලි ආලෝක බල්බ සවි කිරිම සඳහා ලකී බෝයි ක්‍රීඩා සමාජයේ ඉල්ලීම අනුව එම විදුලි ආලෝක කටයුතු සඳහා මාගේ සභා අරමුදල් මගින් රු:80000.00 මුදලක් ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 09 ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>

2022 සභා අරමුදල් සඳහා බලන්තොට උතුරු කලුගල්පතන මාර්ගය සංවර්ධනය කිරිම සඳහා රු:200,000.00 මුදලක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 10 ගරු මන්ත්‍රී කේ.ඕ.සෝමතිලක මහතා</u>

මා වෙත ලබා දෙන සභා අරමුදල් වලින් බෝදාදෙනිය පාරේ නාය යන කොටසේ බැම්ම ඉදි කිරිම සඳහා රු 300,000.00 ක මුදලක් ලබාදීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සදහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 11 ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය මගින් සභාව වෙත ලිපියක් යොමු කර තිබෙනවා වැලිගම්පළ ප්‍රජා ශාලාව අලුත්වැඩියා කර පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිතුමිය වෙත ලබා දෙන ලෙස සායන කටයුතු පවත්වා ගෙන යාම සදහා.ඒ අනුව තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී මහින්ද ගුණසේකර මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.ඒ ප්‍රජා ශාලාවේ සුළු අලුත්වැඩියාවක් තියෙන්නේ.ඒ අවසරය ලබා දීම ඉතාමත් සුදුසුයි.

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා

ගිය වසරේ මං 50000/- වෙන් කරාට තාක්ෂණ නිලධාරිතුමිය ගිහින් ඒ වැඩේ බලලා වාර්තාව සභාවට දීලා තිබුනේ නෑ.ඒ නිසා ඒ මුදල් අවලංගු උනා.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සදහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

06. **කාරක සභා වාර්තා සභා සම්මත කිරිම.**

06 - 01 මුදල් කා.ස - 2022.04.08
06 - 02 නිවාස ප්‍රජා සංවර්ධන කාරක සභාව - 2022.04.06
06 - 03 කාර්මික සේවා කාරක සභාව - 2022.04.06
06 - 04 පරිසර හා පොදු පහසුකම් කාරක සභාව - 2022.04.06
06 - 05 ගැටුම් සමථකරණ කාරක සභාව - 2022.04.06
06 - 06 උපදේශක කාරක සභාව - 2022.03.11

07. **බැංකු සැසදුම් ප්‍රකාශය,අභ්‍යන්තර විගණන වාර්තාව,ලැබීම් සාරාංශය,ගෙවීම් සාරාංශය,ගෙවීම් වාර්තාව,පුස්තකාල ප්‍රගතිය,ආදායම් රැස් කිරිමේ ප්‍රගතිය ඉදිරිපත් කිරිම**

- 2022.03.01 දින සිට 2022.03.31 දක්වා වවුචර් අංක 219 සිට 362 දක්වා ගෙවීම් වවුචර් සභාගත කරන ලදී.
- බැංකු සැසදුම් ප්‍රකාශය

ගිණුම් අංකය - 053100164889286

මාසය - 2022 මාර්තු

| | | |
|---|---|---|
| 2022.03.01 දිනට මුදල් පොතේ ශේෂය | රු: 12,755,106.26 | |
| එකතු කළා මාර්තු මස මුළු ලැබීම් | රු: 6,761,656.45 | |
| අඩු කළා මාර්තු මස මුළු ගෙවීම් | රු: 8,484,245.09 | |
| 2022.03.31 දිනට මුදල් පොතේ ශේෂය | | රු: 11,032,517.62 |

<u>එකතු කළා</u>

නිකුත් කළත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් රු: 596,222.71

<u>රු: 596,222.71</u>
11,628,740.33

<u>අඩු කළා</u>

| | | |
|---|---|---|
| බැංකු ගාස්තු | රු | 108.00 |
| අත ඉතිරි මුදල් | රු: | 22,686.15 |
| තැම්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් | රු: | 48,000.00 |

<u>රු: 70,794.15</u>

2022.03.31 දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය **<u>රු:11,557,946.18</u>**

- 2022 මාර්තු මස ගෙවීම් සාරාංශය

| විස්තරය | මුදල (රු) |
|---|---|
| 01. වැටුප් හා දීමනා | 3,141,385.95 |
| 02. ගමන් වියදම් | 30,250.00 |
| 03. සැලසුම් හා උපකරණ | 838,433.66 |
| 04. ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව හා නඩත්තුව | 201,975.00 |
| 05. ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 231,597.75 |
| 06. පොලී ගෙවීම් ලාභාංශය හා ප්‍රසාද මුදල් | 26,771.66 |
| 07. ආධාර මුදල් දායක මුදල් සහනාධාර | 1,230.00 |
| 08. විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | - |
| **පුනරාවර්ථන වියදම් එකතුව** | **4,471,544.02** |
| 09. ප්‍රාග්ධන වැය | 630.00 |
| 10. ණය ආපසු ගෙවීම් | 200,646.01 |
| **ප්‍රාග්ධන වැය එකතුව** | **201,276.01** |
| **පුන:වැය හා ප්‍රාග්:වැය මුළු එකතුව** | **4,672,820.03** |
| විවිධ ණය හිමියන් | -- |
| කර්:ණය හිමියන් (309-3-1) | 249,966.76 |
| කර්:ණය හිමියන් (309-3-111) | -- |
| කර්:ණය හිමියන් (304-5) | 2,573,240.00 |
| 10% කර්මාන්ත තැම්පත් | 39,011.53 |
| විවිධ තැම්පත් | 671,970.24 |
| මුද්දර තැම්පත් | 14,875.00 |
| දේපල ණය | 9,318.25 |
| සේවක ණය | 704,765.00 |

| | |
|---|---|
| අත්තිකාරම් | 70,880.00 |
| සමුච්චිත අරමුදල | -- |
| ලිපි ද්‍රව්‍ය ගබඩා අත්තිකාරම් | 23,370.00 |
| ජල ගබඩා අත්තිකාරම් | 679,382.72 |
| අගරු චෙක්පත් | -- |
| කර්:ණය ගැතියන් | -- |
| **එකතුව** | 5,036,779.50 |
| **2022.03.31 දක්වා මුළු ගෙවීම් එකතුව** | **9,709,599.53** |

- 2022 මාර්තු මස ලැබීම් සාරාංශය

| • අය විෂයය නාමයන් | මුදල (රු) |
|---|---|
| 10 වරිපනම් හා බදු | 398,691.56 |
| 20 කුලී | 101,423.80 |
| 30 බලපත්‍ර ගාස්තු | 86,804.00 |
| 40 සේවා සඳහා ගාස්තු | 275,397.00 |
| 50 වරෙන්තු ගාස්තු | 9,040.89 |
| 60 වෙනත් ආදායම් | 444,707.40 |
| 70 වෙනත් ආධාර | 2,944,020.95 |
| පුනරාවර්ථන හා ප්‍රාග්ධන ආදායම් එකතුව | **4,260,085.60** |
| ජල ණය ගැතියෝ | 3,800.00 |
| ජල තැම්පත් | 3,000.00 |
| මුද්දර | 7,950.00 |
| විවිධ තැම්පත් | 509,437.41 |
| සේවක ණය | 148,704.00 |
| කර්මාන්ත තැන්පත් | 274,035.67 |
| දේපල ණය | 9,318.25 |
| විවිධ ණය ගැතියෝ | -- |
| අත්තිකාරම් පියවීම | 502,796.80 |
| අත්තිකාරම් පියවීම ජල ගබඩා | 271,008.16 |
| රු 25 මුද්දර | 1,675.00 |
| සැපයුම් හා උපකරණ | 5,200.00 |
| කර්මාන්ත ණය ගැතියෝ | 1,990,000.00 |
| වෙනත් ලැබීම් වල එකතුව | 3,726,925.29 |
| 2022.03.31 දක්වා මුළු ලැබීම් | **7,987,010.89** |

- 2022 මාර්තු මස පුස්තකාල ප්‍රගතිය

01. නව සාමාජික සංඛ්‍යාව - 99

02. සාමාජිකත්වය අලුත් කළ සංඛ්‍යාව - 16

03. පොත් බැහැර දීම - 1319

04. ව්‍යාප්ත සේවා -

- ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම 2022.03.09 වන දින දෙකිඳ ස්වර්ණ පෙර පාසල් දෙමාපියන් සඳහා මනෝ උපදේශන වැඩසටහන

05. රැස්කළ ආදායම(පුස්තකාල)- 3100.00

(නැණසල) - 3255.00

8.**<u>ටෙන්ඩර් මණ්ඩලය</u>**

08 - 01 පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සඳහා සියලුම වර්ගයේ ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| විස්තරය | ශ්‍රී ලංකා ස්ටෝර්ස් 31, කොත්මලේ පාර ,නාවලපිටිය | එල්.එච්.චන්ද්‍රසේකර පුද්ගලික සමාගම 80 රජවීදිය මහනුවර | ජේපලයින් ට්‍රේඩින් පුද්ගලික සමාගම 14 හරස් වීදිය මහනුවර |
|---|---|---|---|
| ඡායා පිටපත් කඩදාසි A4-JK80 GMS | 2850.00 | 2700.00 | 2646.00 |
| ඡායා පිටපත් කඩදාසි A4-Light Colours | 3670.00 | - | |
| ඡායා පිටපත් කඩදාසි A4-Dark Colours | 3750.00 | 3734.99 | 4795.20 |
| ඡායා පිටපත් කඩදාසි A4- Rainbow | 1790.00 | 2006.81 | 2646.00 |
| ඡායා පිටපත් කඩදාසි A3- JK70 GMS | 3650.00 | - | - |
| ඡායා පිටපත් කඩදාසි A3- JK75 GMS | 3750.00 | - | |
| ඡායා පිටපත් කඩදාසි A3- JK80 GMS | 3850.00 | - | 5940.00 |
| ඡායා පිටපත් කඩදාසි B5- JK75 JMS | 1450.00 | - | |
| ඡායා පිටපත් කඩදාසි B5- JK80 JMS | 1790.00 | - | 2160.00 |
| ඡායා පිටපත් කඩදාසි Legal – JK75 JMS | 2850.00 | - | |
| ඡායා පිටපත් කඩදාසි Legal - JK80 JMS | 2950.00 | - | 3780.00 |
| පිටපත් සහිත පරිගණක කඩදාසි- A4(දෙපිට) | 11250.00 | - | 11232.00 |
| පරිගණක කඩදාසි- 70gms,80gms | - | - | 5886.00 |
| 2ply-110 Gsm-Mix Colour (9.5x11)1000 sets | 11250.00 | - | 11232.00 |
| 2ply-(15x11)1000 | 16250.00 | - | 13446.00 |

| | | | |
|---|---|---|---|
| sets | | | |
| ෆයිල් කවර(නිල්) | 22.50 | - | 27.00 |
| පෑන්(නිල් රතු කළු) | 12.50 | 10.96 | 10.15 |
| සෙලෝටේප් (80m) | 330.00 | 295.00 | - |
| සෙලෝටේප් (20m) | 125.00 | - | - |
| සෙලෝටේප් (40m) | 190.00 | - | - |
| සෙලෝටේප් (50m) | | - | 187.92 |
| ලියුම් කවර(12 ෑ10) | 15.00 | - | 7.56 |
| සර්වියට් පේපර් | 140.00 | - | 156.6 |
| CR පොත් පිටු 80 | 115.00 | 81.64 | 88.56 |
| අත් සේදුම් දියර | 360.00 | 610.20 | 259.20 |
| Toner (Canon NPG 28) | - | 10599.99 | 17064.00 |
| Epson ink 774 ink | - | 3700.00 | 4536.00 |
| GT52 ink | - | 3250.00 | 3456.00 |
| Calculator Casio Mj 120 | 3450.00 | | 2376.00 |
| Puncher (L) | 427.50 | 497.99 | 475.20 |
| Puncher (L) | - | - | 4050.00 |
| 369 Stepler Machine | 327.50 | - | 367.20 |
| Box File (Rexon) | 467.50 | - | - |
| Box File(Apex) | 267.50 | - | - |
| Box File(75mm pantner(Cardboard) | - | 331.83 | - |

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව තාක්ෂණික ඇගයුම් කමිටු නිර්දේශය මත අදාල කාර්යය ඉටු කර ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 02 පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාවේ පුස්තකාල අවශ්‍යතා සඳහා උපකරණ මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.

| විස්තරය | සමගි ෆර්නිචර්ස් නිෂ්පාදකයෝ සහ සපයන්නෝ, 05 නගර සභා පාර, නාවලපිටිය | මිත්‍රානි ඩිස්ට්‍රිබියුටර්ස්, 63, බෙලි පාර, නාවලපිටිය | ජයන්ති ටිම්බර් ඩිපොට්, 05, සිනමා පාර, නාවලපිටිය |
|---|---|---|---|
| වීදුරු සහිත වානේ අල්මාරි | 34500.00 | 35000.00 | 36500.00 |
| ප්ලාස්ටික් පුටු ඇදි රහිත | 2530.00 | 2600.00 | 2650.00 |
| ප්ලාස්ටික් මේස | 8500.00 | 8700.00 | 8950.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති නාවලපිටිය, සමගි ෆර්නිචර්ස් යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 03 ඇල්ලවත්ත ගස් ඉවත් කිරීම සඳහා මිල ගණන් කැඳවීම.

| එස්.එම්.එම් හසිතසිරි, 360, ගලමුදුන ජනපදය, රඹුක්පිටිය ,නාවලපිටිය | විජිත කුමාර රත්නායක, උඩ රඹුක්පිටිය, නාවලපිටිය | නාලක ඒකනායක ,උඩ රඹුක්පිටිය, නාවලපිටිය |
|---|---|---|
| 20000.00 | 20500.00 | 21500.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති නාවලපිටිය, රඹුක්පිටිය, එස්.එම්, හසිතසිරි යන අයගෙන් අදාළ කාර්යය සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 – 04 සභාව සතු PF 7405 කැබ් රථය සඳහා ටයර් (265/70/16) මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.

| විස්තරය | නිරෝෂන් ටයර් හවුස් ,ගම්පොල | රිතු ටයර් සෙන්ටර්,අඹගමුව පාර ,නාවලපිටිය | ඔමේගා මෝටර්ස්, ගෙලිඔය |
|---|---|---|---|
| ටයර් | 57500.00 | 61700.00 | 59200.00 |
| ටයර් | 54200.00 | | |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය අවම මිල ගණන් සපයා ඇති ගම්පොල, නිරෝෂන් ටයර් හවුස් යන ආයතනයෙන් අදාල කාර්යය සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 – 05 සභාව සතු 252-6380 කැබ් රථය අළුත්වැඩියා කිරීමේ උපාංග (Mitsubishi L 200 Spare Wheel Bracket Set) මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.

| Up Country Motors ,Nawalapitiya | Omega Motors, Gelioya | Susantha Motors |
|---|---|---|
| 14500.00 | 15250.00 | 15050.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය අවම මිල ගණන් සපයා ඇති නාවලපිටිය, අප් කන්ට්‍රි මෝටර්ස් යන ආයතනයෙන් අදාල කාර්යය සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 – 06 සභාව සතු ZA -5171 JCB යන්ත්‍රයේ අඩි 8 දිග බකට් එකේ පසුපස මට්ටම් තලනය කපා පාස්සා සවිකිරීම සඳහා මිල ගණන් කැඳවීම.

| ඉන්ද්‍රා ඉංජිනියරින් ,නාවලපිටිය | ඔමේගා මෝටර්ස්, නො 24/A ,ගම්පොල පාර ,ගෙලිඔය | උදාරා මෝටර්ස්, නාවලපිටිය |
|---|---|---|
| 55000.00 | 72000.00 | 65000.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නාවලපිටිය, ඉන්ද්‍රා ඉංජිනියරින් යන ආයතනයෙන් අදාළ කාර්යය සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 – 07 සභාව සතු ZA -5171 JCB යන්ත්‍රයේ ඉදිරිපස වීදුරුව හා දකුණු පැත්ත (පැති) වීදුරුව සවි කිරීම සඳහා මිල ගණන් කැඳවීම.

| විස්තරය | ඉන්ද්‍රා ඉංජිනියරින් ,නාවලපිටිය | ඔමේගා මෝටර්ස් ,නො 24/A, ගම්පොල පාර ,ගෙලිඔය | උදාරා මෝටර්ස්, නාවලපිටිය |
|---|---|---|---|
| ඉදිරිපස වීදුරුව | 31000.00 | 35000.00 | 34000.00 |
| දකුණු පැත්ත (පැති) වීදුරුව | 34000.00 | 37000.00 | 39000.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නාවලපිටිය, ඉන්ද්‍රා ඉංජිනියරින් යන ආයතනයෙන් අදාළ කාර්යය සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 – 08 සභාව සතු 252-6380 කැබ් රථයේ AC පද්ධතිය සවිකිරීම සඳහා මිල ගණන් කැඳවීම.

| විස්තරය | උදාර මෝටර්ස්, නාවලපිටිය | St. ජෝසප් වර්ක් ෂොප්, නාවලපිටිය | රේන්බෝ මෝටර්ස්, නාවලපිටිය |
|---|---|---|---|
| කොම්පෙෂර් | 30750.00 | 30200.00 | 29500.00 |
| කූලර් එක | 24000.00 | 22700.00 | 22500.00 |
| කන්ඩෙන්සර් එක | 21000.00 | 21250.00 | 20500.00 |
| H2 පලස් | 4100.00 | 3700.00 | 3900.00 |
| A/C ඔයිල් | 4000.00 | 3650.00 | 3500.00 |
| 134 ගෑස් | 9200.00 | 9200.00 | 8500.00 |
| හෝස් | 7300.00 | 6500.00 | 6500.00 |
| බෝතල් ෂෙල්පර් එක | 3000.00 | 2750.00 | 2700.00 |
| ඕවර් රින්ග් | 2000.00 | 1900.00 | 1700.00 |
| ප්‍රෙෂර් කටවුට් එක | 3100.00 | 3200.00 | 2800.00 |
| සම්පූර්ණ වැඩ කුලිය | 53000.00 | 49000.00 | 48500.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත මිල ගණන් සපයා ඇති රේන්බෝ මෝටර්ස් නාවලපිටිය යන ආයතනයෙන් අදාල කාර්යය සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 – 09 සභාව සතු ජංගම පුස්තකාල සඳහා නාම පුවරු සකස් කර ගැනීමට මිල ගණන් කැඳවීම.

| විස්තරය | ලක්රූ, රඹුක්පිටිය | සම්පත්, නාවලපිටිය | කුමාර වැල්ඩින් ,නාවලපිටිය |
|---|---|---|---|
| නාම පුවරු (3 ෘ2) ප්ලෙක්ස් වලින් මුද්‍රණය කර රාමුව සහිතව සකස් කිරීම | 11500.00 | 12000.00 | 13000.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය අවම මිල ගණන් සපයා ඇති රඹුක්පිටිය. ලක් රූ යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 – 10 කාර්යාලය සඳහා K පෝරම හා ආදායම් පරිපාලකවරුන්ගේ කාර්යාලයට මුදල් බැදීමේ ලේඛන මුද්‍රණය කර ගැනීමට මිල ගණන් කැඳවීම.

| විස්තරය | නිව් ශාස්ත්‍රෝදය ප්‍රින්ටර්ස්, කුලියාපිටිය | මිඩ්ලන්ඩ් ප්‍රින්ටර්ස්, නාවලපිටිය | සොලිඩ්නෙට්, නාවලපිටිය | රාජා ප්‍රින්ටර්ස් |
|---|---|---|---|---|
| K පෝරම | 600.00 | 1300.00 | 1250.00 | 1100.00 |
| ආදායම් පරිපාලකවරුන්ගේ කාර්යාලයට මුදල් බැදීමේ ලේඛන | 1600.00 | 1800.00 | 1750.00 | 1600.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය අවම මිල ගණන් සපයා ඇති කුලියාපිටිය, නිව් ශ්‍රාස්ත්‍රෝද ප්‍රින්ටර්ස් යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 – 11 ශ්‍රී ඥාණ ගනේසර් කෝවිල සඳහා ලබා දීමට බ්ලොක්ගල් (ගල්7 ඃ 4) මිල දී ගැනීමට මිල ගණන් කැඳවීම.

| වික්‍රම ඉදිකිරීම්කරුවෝ, නාවලපිටිය | චමාදි ඉදිකිරීම්කරුවෝ ,මීපිටිය, නාවලපිටිය | M.L ඉදිකිරීම්කරුවෝ ,වලපිටිය, නාවලපිටිය |
|---|---|---|
| 60.00 | 55.00 | 75.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය අවම මිල ගණන් සපයා ඇති නාවලපිටිය, චමාදි ඉදිකිරීම් කරුවන්ගෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 – 12 වල් කපන මැෂිමක් මිල දී ගැනීමට මිල ගණන් කැඳවීම.

| විස්තරය | සීටෙක් හෝල්ඩින්ස්,ගෙලිඔය | සීතා හෝල්ඩින්ස්, නාවලපිටිය | ෆැන්සි මහාල් මෙගා ,නාවලපිටිය |
|---|---|---|---|
| DBL BRUSH CUTTER | 29900.00 | 28200.00 | |
| SINGER BRUSH CUTTER | 38900.00 | 36900.00 | |
| BRUSH CUTTER | | | 24950.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය තාක්ෂණික කමිටු නිර්දේශය මත අදාළ කාර්යය සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 – 13 සභාව සතු 252-6380 දරන කැබ් රථයේ එන්ජින් නොසෙල් සේවා කිරීම සඳහා මිල ගණන් කැඳවීම.

| විස්තරය | උදාරා මෝටර්ස්, නාවලපිටිය |
|---|---|
| ඕවර් ෆ්ලෝ වොෂර් | 3500.00 |
| බුෂ් | 2500.00 |
| රෙපෙයාර් කිට් | - |
| පම්ප් සර්විස් | - |
| පම්ප් රෙපෙයාර් | 11500.00 |
| ඔයිල් සීල් එන තැන ෂාර්ප් පුරවා සෑදීම | 3000.00 |
| පොම්ප් ප්‍රෙෂර් වැල් කිට් | 3500.00 |
| පොම්ප ගලවා සවි කිරීම | 4500.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය මෙම වාහනයේ එන්ජිමක් සවිකර 30000 KM වඩා අධික දුරක් ධාවනය කර ඇති හෙයින් වාහන අළුත්වැඩියා සඳහා සභාවේ ලියාපදිංචි ආයතනය වන උදාර මෝටර්ස්, නාවලපිටිය විසින් අදාළ කාර්යය සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

**<u>09. වෙනත් කරුණු</u>**

සාකච්ඡා කිරිමට වෙනත් කරුණු නොවූ බැවින් ගරු උපසභාපතිතුමා විසින් පැමිණ සිටි පිරිසට ස්තූතිය පළ කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව 1.30 පමණ අවසන් කරන ලදී.

උප සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>
වැසි කාලය ආරම්භ වෙමින් පවතිනවා.ඩෙංගු අවධානම වැඩි වෙනවා.සියලුම ග්‍රාම නිලධාරි වසම් වල ඩෙංගු මර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරමු.ඒ සඳහා ඔබතුමන්ලාගේ අදහස් ලබා ගැනීමට කැමතියි.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
ජනතාව දැනුවත් කිරිමක් පලමුව කරොත් හොදයි කියලා හිතනවා.

<u>ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා</u>
පෝස්ටර් ගැසීම වගේම ප්‍රචාරණයක් සිදු කිරිමත් සුදුසුයි.

<u>ගරු මන්ත්‍රී මහින්ද ගුණසේකර මහතා</u>
සතියක් වගේ කාලයක් ලබා දුන්නොත් හොදයි.ප්‍රචාරණය එහෙම තමයි කරන්න ඕනි.

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>
ශබ්ද විකාශන යන්ත්‍ර මගින් හා දැන්වීම් පුවරු මගින් අදාල දැනුවත් කිරිම කරමු.මාර්ග සංවර්ධන අධිකාරියටත් දැනුම් දෙමු මාර්ග දෙපස කාණු ශුද්ධ කරන්න කියලා.ඒ වගේම තාක්ෂණ නිලධාරි මහතෙකුගේ පුරප්පාඩුවක් අපි සතුව පැවතුනා.ඉන්න තාක්ෂණ නිලධාරි මහතාත් අසනීපෙන් ඉන්නේ.සිකුරාදා තමයි එතුමා සභාවට පැමිණෙන්නේ.

<u>ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා</u>
මහවැලි ගඟට ප්ලාස්ටික් බෝතල් විතරක් නෙවෙයි වැසිකිළි අපද්‍රව්‍ය පවා දානවා.අනවසරයෙන් තමයි ගෙවල් හදන්නේ.සංවර්ධන නිලධාරි ගිහින් බැලුවත් වැඩක් නෑ.

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>
බලංතොට කඩ වීදියේ වැසිකිලි අපද්‍රව්‍ය සියල්ලම මහවැලි ගඟට තමයි යන්නේ.කඩේකට ගිහින් තේ බොන්න විධියක් නෑ.අලුත් සංවර්ධන නිලධාරින් හරහා ඒ ගැටලු ගැන සොයා බලලා වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන්න පුලුවන්.

<u>ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා</u>
අපේ සභාවේ නම් ලොකු වියදමක් යන්නේ ඉන්ධන වියදම් වලට.වාහන අංකයක් වත් නෑ.එකම මාසේ කැබ් රථය අලුත්වැඩියා කරන්න කියලා තැන් තුනකට ගෙවීම් කරලා.එකම දවසේ.ඒවා ගැන විස්තර දානවා නම් හොඳයි.අවුරුද්දක් විතර ඇති කැබ් රථයේ සභාවේ නම ගහලා නෑ කියලා තවම ඒක වෙලා නෑ.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
සභාව පටන් ගන්න මුල් කාලෙම මං කිව්වා අයථා ලෙස ඉන්ධන භාවිතයක් වෙනවා කියලා.නමුත් සභාපතිතුමා කිව්වා එහෙම වෙන්නේ නෑ ඔබතුමාට ඕනි නම් විස්තර ගන්න පුලුවන් කියලා.අදටත් කියන්නේ ඉන්ධන ගහන එකේ අංකය වත් දාන්න.ලක්ෂ 04 වගේ ගානක් ගිහින් තියෙනවා තෙල් වලට.තෙල් ගාස්තුව වැඩි වෙන්න කලින්.අපිට කරන්න පුලුවන් මේ වගේ අනවශ්‍ය වියදම් කපා හරින එක තමයි.මං දවසක් පිරවුම්හලේ ඉන්නකොට 19500/- බිලක් අරගෙන ආවා.ජේසීබී එකට ගැහුවා කියලා තමයි කිව්වේ.රාජු කියනවා මං එදා ජේසීබී එකේ වැඩ කරේ නෑ මං ගැරේජ් එකේ හිටියේ කියලා.කාරුණික ඉල්ලීමක් මේක.ඒ වගේම ටෙන්ඩර් කැඳවීමත් විධිමත් විධියට කරනවා නම් සුදුසුයි.

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>
සභාවේ වාහන භාවිතය හා ඉන්ධන භාවිතය පිළිබඳ සැලකිලිමත් වෙමු.

<u>ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය</u>
තාක්ෂණ නිලධාරි කෙනෙක් නැති එක නම් ලොකු ගැටලුවක්.වැඩ කරන්න බෑ.ඇස්තමේන්තුව හදාගෙන යද්දී බඩු මිල වැඩි වෙලා.තාක්ෂණ නිලධාරි තව සතියකින් එද්දී ආයෙත් භාණ්ඩ මිල වැඩිවෙලා.

<u>ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය</u>
ගිය සභාවේ තිබුණා යෝජනාවක් වැවේගම ජල ටැංකිය ප්‍රතිසංස්කරණය සඳහා භාණ්ඩ ලැයිස්තුවක්.අඟල් 2 බට 7 මං දැක්කා.මැටල් තාච්චි හා වැලි තාච්චි හා සිමෙන්ති එච්චර ප්‍රමාණයක් ගිහින් නෑ.කම්බියක් වත් ගිහින් ඇති කියලා මං හිතන්නේ නෑ.ලක්ෂ 1 ½ බට දුන්නා කියලා කිව්වා.මට දැනගන්න පුලුවන්ද ලක්ෂ 1 ½ බට කොපමණ ලැබුනද කියලා.

<u>ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා</u>
ප්‍රාදේශීය සභාවෙන් තමයි ඒ බට ටික අරන් දුන්නේ.

<u>ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය</u>
සංවර්ධන නිලධාරිතුමියක් ගියා මෙහෙන්.පුලුවන් නම් එතුමිය කැඳවලා විමසීමක් කරන්න.තොරතුරු හොයලා බලනකොට වංචාවක් වෙලා තියෙනවා.යම් ගෙදරකට ගිහින් දාලා තියෙනවා බට ටික.තොරතුරු බලනකොට බට 5 ගානේ විකුණලා තියෙනවා රු:1000.00 කට.මෙතුමා හරියට වැඩේ කරලා ඇති.නමුත් නරක නාමයක් එනවා.පුලුවන් නම් පෞද්ගලිකව අපි සල්ලි එකතු කරලා අපි බට වගයක් ගත්තා.ඒ බට ටිකෙන් ඇනිකට් එකෙන් වතුර ඇවිත් අඟල් 2 බටෙන් ඇවිත් අඟල් 4 බටයකින් පිට වෙනවා.ඒකට සම්බන්ධ කරලා දෙන්න පුලුවන් නම් හොඳයි.පවුල් 45 බොනවා එක පැත්තකින් පවුල් 8 ක් තුන් කාලක බටයකින් බොනවා.පවුල් 45 ටම වතුර නෑ.සභාවේ යම් මුදලක් තියෙනවනම් වැවේගම නාන පිහිල්ලක් තියෙනවා.ඒක ප්‍රතිසංස්කරණයට ලබා දෙන්න පුලුවන් නම් හොඳයි.

<u>ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා</u>
අවුරුදු ගානක් ඉගුරුඔය දිය ඇල්ල ගැන කථා කරා.දැන් 4 දෙනෙකුට විරුද්ධව නඩු දාලා තියෙනවා.අක්කර 17 ක් එයාලා අල්ලගෙන ඉන්නවා.ස්වේච්ඡා සමිතියක් ඒ දේපල ආරක්ෂා කරගන්න මහන්සි වෙනවා.නඩුවට ඉදිරිපත් වෙන්නේ කවුද කියන එක ගැටලුවක්.දංගොල්ල පාරේ ගැටලුව සමථ මණ්ඩලයට දාලා තියෙනවා.මේක ඉහළ උසාවියට දාලා තියෙනවා.සභාවෙන් හරි මැදිහත් වෙලා එයාලාට සාධාරණයක් කරන්න පුලුවන් නම් හොදයි.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
දෙල්ගහඇල්ල සුසාන භූමිය සම්බන්ධව මං ගිය සභාවේ කථා කරා.මොල්ලිගොඩ මන්ත්‍රීතුමාගේ නමට තමයි හානියක් වෙලා තියෙන්නේ.බඩු මිල වැඩි වෙනකොට මුදලාලිලා ක්ෂණිකව මිල වැඩි කරනවා.ජීවත් වෙන්න හරිම අමාරුයි.අපට මේකට මැදිහත් වීමක් කරන්න පුලුවන් නම් හොදයි.අදත් වැඩ වර්ජනයක් වෙනවා.අසරණ ජනතාවට පිහිටක් වෙන්න පුලුවන් නම් හොදයි.ඉදිරියට විදුලි බිලත් වැඩි වෙනවා කියලා කියනවා.සොහොන පිළිබද වාර්තාවක් ඕනි.

<u>ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා</u>
දෙල්ගහඇල්ල සුසාන භූමියේ ගැටලුවේදී එයාලා කියනවා සල්ලි දීලා ගත්තේ කියලා.නමුත් ලියවිල්ලක් වත් පෙන්නන්නේ නෑ.ඔබතුමා විශේෂ මැදිහත් වීමක් කරන්න.මටත් ලොකු වේදනාවක්.සභාවේ කිප වතාවක් කථා කරත් කිසි ප්‍රගතියක් නෑ.

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>
සභාවේ ලියකියවිලි ඇති.මිනින්දෝරු සැලැස්ම අනුව මැනීම් කටයුතු කරමු.

<u>ගරු මන්ත්‍රී මහින්ද ගුණසේකර මහතා</u>
වැලිගම්පළ පාලමේ විතරක් මුදල් ඇවිත් නෑ.මාස 6ක් විතර වෙනවා.වෙළද ව්‍යාපාරිකයා තමයි ජනතාව සූරා කන්නේ.පාරිභෝගික සේවා අධිකාරියට වත් සභාවෙන් ලියුමක් යවමු.

<u>ගරු මන්ත්‍රී එස්.ඒ.ටී.පුෂ්පකුමාර මහතා</u>
නාවලපිටියේ වෙළද මාෆියාවක් තියෙනවා.වෙළද සංගමය දැනුවත් කරමු.රජය අපහසුතාවයට පත් කරන්න කරනවාද දන්නේ නෑ.දෙකිද ජල ගැටලුවක් නෑ.ඔබතුමිය වතුර වෙනුවෙන් මුදල් වියදම් කරේ නෑ.මට ලැබුණ ප්‍රතිපාදන වලින් බට ටික අරන් දුන්නා.රේල් පාර හරහා බට ගන්න එක නීත්‍යානුකූල නෑ.බලහත්කාරයෙන් තමයි බට ටික දැම්මේ.රේල් පාරේ බට ටික වලලන්න බෑ.අපිට බට ටික ගලවන්න උනා.විකුණලා තියෙනවා කියලා කියනවා නම් ඔබතුමිය ලිඛිතව දෙන්න විමර්ශනයක් කරන්න.වැල් දෙකක් දාලා මං වතුර දෙන්න කටයුතු කරා.වැවේගම නිසි ක්‍රමවේදයක් තිබුනේ නෑ.අපි ක්‍රමවේදයක් හැදුවා.ගැටලුව තියෙන්නේ මිනිස්සු ලග වතුර එක්රැස් කිරිමේ ක්‍රමවේදයක් තිබුනේ නැති එක.වැවේගම ගොඩක් අය හොරෙන් වතුර අරන් තියෙන්නේ.මං ඉල්ලීමක් කරනවා ඔබතුමිය ලක්ෂ 03 ක් දාන්න මං ලක්ෂ 03 ක් දාන්නම්.අවශ්‍ය බට ටික අරන් දෙමු.

<u>ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය</u>
මං හිතන්නේ බට අවශ්‍ය වෙන්නේ නෑ.ගෙවල් 3යි සභාවේ ලියාපදිංචි වෙලා ඉන්නේ.අනිත් ඔක්කොමලා හොරෙන් ගන්නේ.විධිමත් විධියකට වතුර දෙන්න කියලා මං කියන්නේ.මං පැය 1 ½ හිටියා ටැංකිය ළග.ටැංකිය පිරුණා.සභාව මැදිහත් වෙලා නීතිය ක්‍රියාත්මක කරන්න.

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>
දෙල්ගහඇල්ල සුසාන භූමිය සම්බන්ධ ඉදිරි කටයුතු ඉක්මනින් සිදු කරන්න.ඒ වගේම මෛත්‍රීපාල මන්ත්‍රීතුමා කිව්ව ඉගුරුඔය දිය ඇල්ල සම්බන්ධ ගැටලුවේ සභාවේ නම කිසිම තැනක සදහන් වෙලා නෑ.සභාව කල් ඇරියා

වැඩි මේ සම්බන්ධයෙන් පියවරක් ගන්න.අධිකරණමය වැඩ කටයුත්තක් නිසා අපිට මේකට මැදිහත් වෙන්නත් බෑ.

<u>ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා</u>
හරියට නඩුව ගියොත් එයාලා මිලදී ගත්ත ටික අයින් කරලා ඉතිරිය සභාවට පවරා ගන්න පුලුවන්.අපේ නිලධාරියෙක් ගියොත් එතන පරික්ෂා කරලා හරියටම තොරතුරු දැනගෙන තමයි යන්න ඕනි.පත්තුනුපිටියෙත් එහෙම ගැටලුවක් උනා.

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>
සභාව සතු ජීප් රථයේ අපි යෝජනාවක් ගත්තා අලුත්වැඩියා කරලා ගමු කියලා.ඒ වෙනකොට එන්ජිම හොද තත්ත්වයේ තිබුණා.දැන් තත්ත්වයේ විධියට ලොකු ගානක් වියදම් කරන්න වෙනවා වාහනය හදා ගන්න.ඒ නිසා ඒ වැඩේ නැවැත්වීම සුදුසුයි කියලා මං හිතනවා.

<u>ගරු මන්ත්‍රී මහින්ද ගුණසේකර මහතා</u>
ණය මුදලක් ගන්න එක ලොකු ගැටලුවක්.ගෙවන්න හැකියාවක් තියෙනවද කියලත් බලන්න ඕනි.කාර්යාලයේ වැසිකිලි පද්ධතිය හදන්න මුදල් වෙන් කරලා තියෙනවාද ලේකම්තුමිය.මේ වෙලාවේ ලක්ෂ 22 වෙන් කරන එක ඇත්තටම ගැටලුවක්.අපි දන්නෙත් නෑ.